**අලව්ව ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------------**

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**-----------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී උපයෝගී කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුළින් අනාවරණය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.10,000 ක් සහ රු.40,000 ක් වූ පිළිවෙලින් එරමිනියාවල්ගල වත්ත සහ මහාරව්විමුල්ල කන්දේ ගෙදර ඉඩම්වල වටිනාකම් ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ආ) රු.535,000 ක් වටිනාකම වූ ජල බවුසරය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) බිත්ති විදුලි පංකා 02 ක වටිනාකම රු.19,500 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඈ) පිරිවැය රු.9,180 ක් වූ වීරි රේබා සහතික පොත්වල වටිනාකම රු.259,200 ක් ලෙස රු.250,020 ක් වැඩියෙන් ගිණුම්වලට ගෙන තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාළ රු.29,530 ක ගිවිසුම් තැන්පතුවක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඊ) සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය වෙනුවෙන් ප්‍රතිපූර්ණ කළයුතු රු.192,240 ක් වූ හිඟ වැටුප් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසයට අදාළ රු.126,043 ක් වූ වෙළඳ ස්ථාන කුලී රු.98,770 ක් ලෙස රු.27,273 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.3.3 නොසැසඳුණු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ ලේඛනවල හා උපලේඛනවල පැවති ශේෂයන් අතර රු.1,127,598 ක නොසැසඳීම් පැවතුණි.

**1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

(අ) ලැබියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.31,221,658 ක් වූ ලැබියයුතු ගිණුම්වල වසරකට වැඩි කාලයක සිට අයවීමට පැවති ශේෂය රු.1,175,297 ක් විය.

(ආ) ගෙවියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.27,197,966 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂයෙන් වසරක් ඉක්මවා නිරවුල් කර නොතිබුණු ශේෂය රු.9,596,714 ක් විය.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.53,549,684 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1998 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) | | |
| 180 රීතිය | - | සභාවට අයත් මහරච්චිමුල්ල හා කැප්පිටිවලාන උප කාර්යාල දෙකේ ස්ථාන භාර නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 | 190,326 | වර්ෂ 02 ක කාලය ඉක්මවූ තැන්පත් 53 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,599,669ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,623,593 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

----------------

කැප්පටිවලාන උප කාර්යාලයේ දෛනික මුදල් බැංකුගත කිරීම වැඩි වශයෙන් මාර්ග කම්කරුවන් විසින් සිදු කර තිබුණි. 2017 වර්ෂය තුළදී මාර්ග කම්කරුවන් විසින් අවස්ථා 51 කදී රු.724,252 ක මුදලක් අලව්ව ලංකා බැංකුවේ තැන්පත් කර තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017වර්ෂය | | | | 2016 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| I. වරිපනම් හා බදු | 2,946 | 3,461 | 3,744 | 920 | 2,786 | 2,648 | 2,846 | 1,204 |
| II. බදු කුලී | 10,996 | 9,794 | 9,655 | 190 | 8,662 | 10,668 | 10,641 | 40 |
| III. බලපත්‍ර ගාස්තු | 1,502 | 1,917 | 1,963 | - | 1,409 | 1,712 | 1,712 | - |
| IV. වෙනත් ආදායම් | 71,131 | 66,507 | 71,975 | 17,631 | 71,679 | 74,266 | 74,266 | 12,270 |
| එකතුව | 86,575 | 81,679 | 87,337 | 18,741 | 84,536 | 89,294 | 89,465 | 13,514 |

සටහන

2017 වර්ෂයේ රැස්කළ ආදායම් තුළ පෙර වර්ෂවල රු.785,271 ක් වූ හිඟ අය කිරීම්ද ඇතුළත්ව තිබුණි.

**2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම වූ රුපියල් මිලියන 82 ක් රැස්කළ ආදායම රුපියල් මිලියන 87 ක් වූ අතර පසුගිය වර්ෂවල හිඟ සමඟ සමාලෝචිත වර්ෂය අවසානයට රුපියල් මිලියන 18 ක් තවදුරටත් අයකර ගැනීමට තිබුණි.

**2.3.3 වරිපනම් හා බදු**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවියයුතු වරිපනම් සහ අක්කර බදු රු.920,786 ක් විය.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. 4,518,250 ක් සහ රු.13,000,000 ක් උසාවි දඩ සහ මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රධාන හා අනු කාරණා සම්බන්ධයෙන් පළාත් සභාව විසින් සම්මත කළ පොදු අතුරු ව්‍යවස්ථා 54 ක් වැළඳගෙන තිබුණි.

(ආ) ප්‍රතිපාදන නොසැලසීම.

සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් ප්‍රතිපාදන සලසා නොතිබුණු කර්මාන්ත 05 ක් රු.3,263,172 ක වියදමකින් නිමකර තිබුණි.

(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

2014 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන යටතේ අලව්ව නගර ශාලාවේ ඉදිකිරීම් ආරම්භ කර වසර 03 ක් ඉක්මවා තිබුණද කර්මාන්තය නිම කිරීමට අදාල පියවර සභාව විසින් ගෙන නොතිබුණි. මේ තුළින් සභාවට ලැබීමට තිබූ ආදායම් අහිමිවීම, මහජන සේවය නොලැබීම හා සම්පත් නාස්ති වීම සිදුවී තිබුණි.

(ඇ) සන අපද්‍රව්‍ය කළමණාකරණය

-----------------------------------

සභාව විසින් දෛනිකව රැස් කරන කසළ යොදාගෙන 2017 වර්ෂයේ කාබණික පොහොර කිලෝ ග්‍රෑම් 18,912 ක් නිෂ්පාදනය කර තිබුණි. සන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.12,311,210 ක් වැයකර තිබුණි.

(ඉ) පාරිසරික ගැටළු

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

i. 2014 වර්ෂයේ දැයට කිරුළ ව්‍යාපෘති යටතේ ඉදිකර පාවිච්චි කිරීම ආරම්භ කර තිබුණු අලව්ව බස් නැවතුම්පොලේ පොදු වැසිකිලියේ ගලි වලවල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් උතුරා යාම් සිදුවන අවස්ථාවලදී මුළු නගරයටම එය අහිතකර ලෙස බලපා තිබුණි.

ii. වයඹ සංවර්ධන අරමුදල යටතේ මීටර් 148.05 ක් දිගට කුට්ටිගල් අල්ලා සංවර්ධනය කරන ලද අලව්ව දකුණු ජනරජ මාවත 03 වන පටුමගෙහි වතුර බැස යාම සඳහා මාර්ගය දෙපස කාණු ඉදිකර නොතිබුණි.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

සභාවෙහි තිරසර සංවර්ධන ඉලක්කයන් ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජූලි 31 දිනැති අංක බීඩී/සීබීපී/4/1/2-2018 දරණ චක්‍රලේඛය අනුව සභාව විසින් අයවැය ඇස්තමේන්තුව සකස් කිරීමේදී එම චක්‍රලේඛයෙන් හඳුන්වා දී තිබූ නව ප්‍රතිපත්ති උපාය මාර්ග පදනම් කරගෙන නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂය තුළ ඉදි කරන ලද අලව්ව බස් නැවතුම්පල අසල මාළු කඩ 04 ක් සඳහා ජල හා විදුලි සම්බන්ධතා 2018 පෙබරවාරි මාසය වන විටත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මීට අමතරව 2016 වර්ෂයේ ඉදි කිරීම් නිමකළ අලව්ව බස් නැවතුම්පල කඩ කාමර 28 ක් සඳහාද ජල හා විදුලි පහසුකම් 2018 මැයි මාසය වන විටද ලබා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් මෙම වෙළඳසැල් ලබාගත් ව්‍යාපාරිකයින් දැඩි අපහසුතාවයට පත්ව තිබුණි.

(ආ) සැපයීම් හා සේවා නිසි පරිදි ඉටුකර නොතිබියදී 2017 නොවැම්බර් 21 සහ 2017 දෙසැම්බර් 27 දිනයන්හි රු.264,321 ක් වටිනා චෙක්පත් 02 ක් පිළියෙල කර 2018 ජනවාරි 30 දින වන විටත් විෂය ලිපිකරු භාරයේ රඳවාගෙන තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

ද්විතියික අංශයේ තනතුරු 07 කට අදාළව පුරප්පාඩු 15 ක් හා ප්‍රාථමික අංශයේ තනතුරු 02 කට අදාළව පුරප්පාඩු 02 ක් පැවතුණු අතර පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කර තිබූ සංවර්ධන නිලධාරීන් 15 දෙනෙකු අතිරික්තව පැවතුණි. තනතුරු 04 කට අදාළව අතිරික්ත සේවකයින් 15 ක් සේවයේ යොදවා තිබුණු අතර, තනතුරු 04 කට අදාළව අනියම් සේවකයින් 08 ක් බඳවාගෙන තිබුණි.

(ආ) සේවක ණය

විශ්‍රාම යාම, මියයාම සහ ස්ථාන මාරු වීම මත අය නොවන සේවක ණය ශේෂය රු.23,613 ක් විය.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

කැප්පිටිවලාන නගරයේ පොදු වෙළඳපොල කඩ කාමර 14 ක් හා තාවකාලික කඩ කාමර 07 කින් කඩ කාමර 02 ක් පමණක් දැනට ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන අතර අනෙකුත් කඩ හිමිකරුවන් විසින් වාර්ෂික බදු මුදල් ගෙවීම් කර තිබූ නමුත් මාසික බදු කුලිය රු.450 හා 650 අතර ඉතා අඩු වටිනාකමක් විය. මූලික පහසුකම් පවා මෙම වෙළඳසැල් තුළ නොතිබීම මත බදුකරුවන් වෙළඳ සැල් පවත්වාගෙන යාමේ උනන්දුව අඩු වී තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

2014 වර්ෂයේදී පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.6,390,000 ක් වූ ඩබල් කැබ් රථය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.5.2 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

කැප්පිටිවලාන උප කාර්යාලය හා පුස්තකාලය අසල අක්කර 02 ක් විශාල ඉඩම කිසිදු ඵලදායී කටයුත්තකට යොදාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.6 ප්‍රසම්පාදනය

----------------

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

සභාව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 4.2.1 (අ), (ආ), (ඇ) සහ (ඉ) විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 3.6.2 සැපයීම් හා සේවා

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.1 (අ) ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛන තැපැලෙන් හෝ පෞද්ගලිකව හෝ ලංසුකරුවන්ට ලබා ගැනීමට මෙන්ම 6.3.1 ප්‍රකාරව ලංසු ඉදිරිපත් කිරීම සිදුකළ යුතු වුවත්, රු.1,489,094 ක් වූ මිලදී ගැනීම් අවස්ථා 32 කට අදාළව ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කිරීම මෙන්ම ලංසු ලබා ගැනීම සභා නිලධාරීන් විසින් ක්ෂේත්‍රයේදී සිදුකර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන පරිදි වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ මිලදී ගැනීම් සිදු කිරීමේදී 3.4.3 (ඇ) පරිදි ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ලියාපදිංචි ලැයිස්තුවට පමණක් සීමා නොවී අවස්ථා 37 කදී රු.1,590,304 ක මිලදී ගැනීම් සභාවේ ලියාපදිංචි නොවූ අයතනවලින් සිදුකර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2 (අ) ප්‍රකාරව මිල සැදැහුම් කැඳවීම් සඳහා වූ ඉල්ලීම්වල භාණ්ඩ පිළිබඳ විස්තර, අවශ්‍ය ප්‍රමාණය, වගකීම් කාලය, මිල ගණන්වල වලංගු කාලය, භාණ්ඩ ප්‍රවාහනය සිදුකරන්නේද සහ ඉදිරිපත් කරන ලද මිල ගණන්වල බදු ඇතුළත්ද යන කරුණු ඇතුළත්ව නොතිබුණි.

### 3.6.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පොරමඩල - කොස්කන්ද ජල ව්‍යාපෘතියේ ඉදිකර තිබූ ළිඳෙහි අවසන් ගෙවීම් වාර්තාව අනුව රු.68,434 ක ගෙවීමක් කර තිබූ කොන්ක්‍රීට් කවර් ස්ලැබ් කොටස 2018 පෙබරවාරි 19 දින වනවිටත් ඉදිකර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තිය ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධානවලට නිශ්චිත කාලයක් තුළ ලබාදී තිබියයුතු මුළු කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 02 ක් නොඉක්මවිය යුතු වුවත්, එක් ග්‍රාම සංවර්ධන සමිතියකට රු.3,446,428 ක් වූ කොන්ත්‍රාත් 02 ක් ලබාදී තිබුණි. තවද, කොන්ත්‍රාත්තුව පිරිනැමීමට වසර 02 කට කලින් සමිතියක් වශයෙන් ලියාපදිංචි කර තිබිය යුතු වුවද, අදාල සමිතිය 2016 ජූනි 16 දින මාර්ග අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන අංශයේ ලියාපදිංචි කර තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (අ) වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථීත්වය විසින් වැඩ ඉටු කිරීම සම්බන්ධයෙන් සමිතියේ ධාරිතාවය ගැන සෑහීමකට පත් වූ බවට අදාළ ලියවිලි සභාව සතුව නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් කර තිබූ රු.1,100,000 ක අයවැයගත ප්‍රතිපාදන සලසා තිබූ කර්මාන්ත තුනක් සමාලෝචිත වර්ෂයේ නිමකර නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

------------------------

සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර තිබූ නමුත්, මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද අභ්‍යන්තර විගණන ඒකකයේ රාජකාරි පවරා තිබූ නිලධාරියාට වෙනත් රාජකාරිද පවරා තිබීමෙන් අභ්‍යන්තර විගණනයේ කටයුතු ස්වාධීනව සිදු කිරීමට නොහැකි වී තිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම. |
| (ආ) වත්කම් | i. | ලේඛනගත නොකිරීම. |
| | ii. | පවරා නොගැනීම. |
| | iii. | ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| (ඇ) ණයගැති/ණයහිමි | | ලේඛන පවත්වාගෙන නොයාම. |
| (ඈ) සේවක කළමනාකරණය | | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම. |
| (ඉ) ව්‍යාපෘති/කොන්ත්‍රාත් | | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම. |